# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඞකරණලදී.

නො. 6,975 — 1918ක්වූ නොවැම්බර් මස 8වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපාඞගනීති.

### වර්‍ෂ 1906යේ නාගරික පාඨශාලා ආඥාපණත.

කොළඹ නාගරික සභාවට යටත් ප්‍රදේශය පිළිබඳව වර්‍ෂ 1916යේ 34වෙනි ආඥාපණතින් පිළියම්කරනුලැබූ 1906යේ නාගරික පාඨශාලා ආඥාපණතේ 7 (1) වෙනි වගන්තියෙන් පවරණලද බලය කරණකොටගෙණ අධ්‍යාපනාධ්‍යක්‍ෂතැන විසින් සම්පාදනයකරණලද මෙහි පහත තිබෙන සුළු අණපනත් නීතිවිධායක සභාවේ මන්ත්‍රණය ඇතුව ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ස්ථිරකරණලද බැව් මෙයින් දන්වමි, එකී නාගරික ප්‍රදේශයෙහි යථෝක්ත ආඥාපණතේ අනායාගීත නියෝග පැවැත්වීම ආරම්භකරණු සඳහා පළකළ 1918 අගෝස්තු මස 15වෙනි දින දරණ ප්‍රකාශ පත්‍රයෙහි ඒ ප්‍රදේශයේ මායිම් නියම වශයෙන් දක්වනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
(අත්සන්කළේ), ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරීස් වම්භ.

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින කොළඹ
මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

### සුළු අණපණත්.

1. පදනි—මේ සුළු අණපණත්වල "පිරිමි ලමයා" "ගැණු ලමයා" "ලමයා" යන්නෙන් කොළඹ නගරයේ මරදාන, අළුත්කඩේ, සන්ත පාවුලු යන නාගරික කොට්ඨාසවල සීමාතුළ වසන පිරිමි ලමයෙක් හෝ ගැණු ලමයෙක් හෝ ලමයෙක් කියනුලැබේ.

"දෙමව්පිය" යන්නෙන් ලමයෙකුගේ භාරකාරත්වය සැබවින්ම දරන්නාවූ යම්කිසි අයෙක් කියනු ලැබේ.

"ව්‍යවස්ථා පොත" යන්නෙන් නීතිවිධායක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරණලද ඒ ඒ කාලයෙහි පවත්නා ආධාර පාඨශාලා ව්‍යවස්ථා පොත කියනුලැබේ.

"පැමිණ සිටීම" යන්නෙන් ව්‍යවස්ථා පොතේ නියමය පරිදි දිනපතා ලේඛනයෙහි සටහන්කරණලද පැමිණියයුතු සම්පූර්ණ කාලයයි ව්‍යවස්ථා පොතේ නියමිත කාලයතුළ නැවතීම කියනුලැබේ.

"පාඨශාලාව" යන්නෙන් මීට අමුණනලද ලේඛනයේ සඳහන්වූ පාඨශාලාවලින් එකක් කියනු ලැබේ. ඒ පදයෙන් මීට පසු පිහිටුවනු ලබන ස්වභාෂා ප්‍රසිඞ පාඨශාලාද කියනු ලැබෙත්.

"පාඨශාලා පරීක්‍ෂකතැන" යන්නෙන් ආණ්ඩුව විසින් පත්කරණලද පරීක්‍ෂක කෙනෙක් නොහොත් උප පරීක්‍ෂක කෙනෙක් කියනු ලැබේ.

"ලමයෙකුගේ ඉගෙණීම ගැණ සෑහෙන ප්‍රමාණවත් සුදුසු කටයුතු සලස්වා තිබීම" යන්නෙන්ද "යුතු කරුණු" යන්නෙන්ද වර්‍ෂ 1906යේ නාගරික පාඨශාලා ආඥාපණතේ, 1 (*b*) යන උපවගන්තියෙහි තිබෙන අර්ථ කියනු ලැබෙත්.

2. පාඨශාලාවට යායුතු ලමයි—අවුරුදු 6ට අඩුනොවූද අවුරුදු 12ට වැඩිනොවූද සියලු ලමයින්ගේ දෙමව්පියන් විසින්ද මහමත් භක්තික නොවන අවුරුදු 6ට අඩුනොවූද අවුරුදු 10ට වැඩිනොවූද සියලු ගැණු ලමයින්ගේ දෙමව්පියන් විසින්ද එබඳු පිරිමි ලමයා හෝ ගැණු ලමයා මීට අමුනා තිබෙන ලේඛනයේ සඳහන්කරණලද පාඨශාලාවලින් එකකට හෝ මීට පසු ආරම්භ කරණ ප්‍රසිඞ ස්වභාෂාපාඨශාලාවකට හෝ යාමට සැලැස්විය යුතුය. ඔහු විසින් එබඳු පිරිමි ලමයාගේ හෝ ගැණු ලමයාගේ ඉගෙණීම ගැණ අන්‍ය සෑහෙන ප්‍රමාණවත් සුදුසු කටයුතු සලස්වා තිබේනම් නැතහොත් ඔහුගේ හෝ ඇගේ නොපැමිණීම ගැණ යුතු කරුණක් තිබේනම් එසේ යාමට සැලැස්වීම උවමනා නොවේ. එහෙත් සැතැප්ම තුණකට වඩා දුරක සිට පාඨශාලාවකට පැමිණීමට ලමයින්ට බලනොකට යුතුය, (*b*) ස්වකීය නිවසේ සිට සැතැප්ම දෙකකට වඩා දුරවූ පාඨශාලාවකට යාමට වයස අවුරුදු අටට අඩු වයසේ පිරිමි ලමයින්ට බලනොකට යුතුය. (*c*) ස්වකීය නිවසේ සිට සැතැප්ම දෙකකට වඩා දුරවූ පාඨශාලාවකට යාමට හෝ ගැණු ගුරුවරියක් නැති පාඨශාලාවකට යාමට ගැණු ලමයෙකුට බලනොකටයුතුය.

3. පැමිණ සිටින කාලය—පිරිමි ලමයෙක් හෝ ගැණු ලමයෙක් හෝ පාඨශාලාවේ ගතකරණ කාලය සමාන වයසේ ලමයින්ට ඉගැන්වීමට පාඨශාලාව පවත්වන මුළු කාලයවේ.

4. ඉගැන්වියයුතු පාඩම් පඞ්ක්තිය—පාඨශාලාවේදී ඉගැන්විය යුතු පාඩම් පඞ්ක්තිය නම් ඒ ඒ කාලයේදී බලංගුව පවතින ව්‍යවස්ථා පොතේ නියමිත පාඩම් පඞ්ක්තියවේ.

5. ආගම—(*a*) එහෙත් 1906 නාගරික පාඨශාලා ආඥාපණතේ 9වෙනි වගන්තියේ 2 (*d*) උප වගන්තියේ නියමිත පරිදි ආගම ඉගැන්වීමට නියමිත කාලයේ පඞ්ක්තියට නොපැමිණ සිටීමට අවකාශදීමට මේ සුළු අණපණත්හි යම් බාධාවක් කොසිම විටකවත් නැති බවද.

(*b*) ස්වකීය දෙමව්පියන් අදහණ ආගම, අදහණ සමූහයාගේ ආගමානුකූල කටයුතු කිරීමට සම්පූර්ණයෙන් වෙන්කළ දිනක යම් ලමයෙකුගේ පැමිණීම පිණිස නියමයක් කොයි විටකවත් මේ සුළු අණපණත්හි නැතිබවද සැලකිය යුතුයි.

6. තවද අවුරුදු 10ටත් 12ටත් අතර වයස් ඇත්තාවූද අධ්‍යපනාධ්‍යක්ෂ තුමාගේ සිත තුටුවෙනාකාර ප්‍රයෝජනවත් කටයුත්තක යෙදී සිටින්නාවූද යම් ලමයෙක් ඒ කාලයෙහි වලංගුව පවත්නා ව්‍යවස්ථා පොතේ හතරවෙනි ප්‍රමාණයට නියම කියවීම, ලිවීම, ගණන් යන මේවායින් ඔහු සම්පූර්ණබවට පාඨශාලා පරීක්ෂකතැනගෙන් සහතික පත්‍රයක් ලබාගෙණ සිටි නම්, පාඨශාලාවට ඒමට ඔහුට බලනොකට යුතුය.

7. වරදවලට දඬුවම්—මේ සුළු අණපණත් නොහොත් ඉන් යම් අණපණතක් පරිදි ක්‍රියානොකරණ හෝ නොසලකන හෝ ඒවා නොහොත් එය කඩකරණ සියළු දෙමව්පියන් වරදකාරයන් බැව් ඔප්පුවුයිනම් ඔවුන්ට රුපියල් 10ට වැඩිනොවන දඩයක්ගසනු ලැබේ; දඩ මුදල නොගෙවන ලද්දේනම් සතියක් හිරේ සිටීමට නියමකරණු ලැබේ. මේ ඇර වැරැද්ද කෙරිගන යන එකක් වේනම් දවසකට රු. 2කට වැඩිනොවන දඩයක් බැගින් වැඩිපුර දඬුවමකටද යටවිය යුතුවේ.

---

### කොඨාස සහ ඒවායේ තිබෙන පාඨශාලා.

| පාඨශාලාව. | පඩිකාතිය. | කළමනාකාර නාම. |
|---|---|---|
| **සත්ත පාවුලුගේ කොඨාසය.** | | |
| සෙන්ත්ජුවාන්ගේ සිංහල සහ දෙමළ | මිශ්‍ර | රෝමානුකතෝලික |
| සෙන්ත්ජුවාන්ගේ දෙමළ | එම | වැස්ලියන් |
| මදුසතුල් සම්දියා දෙමළ | පිරිමි | මහමත් |
| **අළුත්කඩේ කොඨාසය.** | | |
| බැල්මෝන්ත්විදිය දෙමළ | මිශ්‍ර | වැස්ලියන් |
| බබල්විදිය දෙමළ (එම කළමනාකාරකම්පිට පවත්වන මරදානේ පාඨශාලාවේ හල්ව්ෂෝර්ජ්සි සීමාව | එම | චර්ච්මිෂනාරි |
| **මරදාන කොඨාසය** | | |
| මරදානේ ශිෂ්‍ය නිවස | ගැහැණු | බැප්ටිස්ට් |

| පාඨශාලාව. | පඩිකාතිය. | කළමනාකාර නාම. |
|---|---|---|
| **මරදාන කොඨාසය.** | | |
| මරදාන | ගැහැණු | බෞද්ධ |
| එම (සත්තයුක්ගේ) | එම | චර්ච්මිෂනාරි |
| එම දෙමළ | මිශ්‍ර | එම |
| එම | එම | වැස්ලියන් |
| මරදානේ මුස්ලිම් සහිර දෙමළ | පිරිමි | මහමත් |
| දෙමටගොඩ සත්ත මතෙව්ගේ | මිශ්‍ර | එංගලන්තසභාව |
| බේරැල්ලේ සියළු සාන්තුවරයන්ගේ සිංහල සහ දෙමළ | එම | රෝමානුකතෝලික |
| මාලිගාකන්ද | එම | ආණ්ඩුවේ |
| නිල්විදියේ ආණ්ඩුවේ පාඨශාලාව | | |
| කොළඹ නාගරික පලාතේ පිහිටි පිළිගත් අන්‍ය පාඨශාලා | | |

---

වර්ෂ 1898වේ 13වෙනි ආඥාපණතේ 57වෙනි වගන්තිය යටතේ මිනුවන්ගොඩ ප්‍රදෙශක සමිතිය විසින් සාදනලදුව 1918වේ මාර්තු මස විසිඅටවෙනි දින පළකරණලද අංක 6,932 දරණ ගැසැට්පත්‍රයේ ප්‍රසිද්ධවූ "අනතුරය සහිත සහ අප්‍රිය වෙළඳාම්" යන පරිච්ඡේදය යටතේ තිබෙන 1වෙනි අතුරු පණත වෙනුවට මෙහි පහත දක්වනු ලබන ප්‍රතිසංස්කරණය කරණලද අතුරු පණත මිනුවන්ගොඩ ප්‍රදෙශක සමිතිය විසින් සාදනලදී. තවද එම අතුරුපණත නීතිප්‍රතිපාදක මන්ත්‍රන් සභාවේ සම්මතය පිට ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරණලද බව මෙයින් දැනුම්දෙනලදී.

තවද 1918වේ මාර්තු මස 28වෙනි දින දරණ අංක 6,932කේ ගැසට්පත්‍රයෙහි පෙණෙන අතුරු පනත්වලට යාකරන ලද ලේඛණය "යන්ත්‍ර මාර්ගයෙන් පොල්තෙල් සාදන කර්මාන්තශාලා" යන වචන වෙනුවට "යන්ත්‍ර මාර්ගයෙන් පොල්තෙල් සෑදීම හෝ පොල් කපා වේලීම හෝ ඒ කර්මාන්ත දෙකම මිශ්‍රව කිරීම" යන වචන යෙදීමෙන් මන්ත්‍රසභා ප්‍රාප්ත ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ සම්මතය ඇතුව ප්‍රතිසංස්කරණය කළබවද මෙයින් දැනුම්දෙනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
ආර්. ඊ. ස්ටබ්ස්,
මහසෙක්‍රතාරිස් වම්හ.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

### අතුරු පණත.

යන්ත්‍ර මාර්ගයෙන් සාදන පෝර ගබඩාකර තැබීම හෝ සෑදීම, ලේ හෝ නරක මස් තැම්බීම, ලේ හෝ නරක මස් වේලීම, සම්පදම්කිරීම, සතුන්ගේ තෙල උණුකිරීම, සතුන්ගේ තෙල්ගැනීම, සබන් සෑදීම, පොල්ලෙලි පෙගවීම, කොහු සායම්කිරීම, යන්ත්‍රමාර්ගයෙන් පොල්තෙල් සෑදීම හෝ පොල් කපා වේලීම හෝ ඒ කර්මාන්ත දෙකම මිශ්‍රකොට කිරීම, කොහු කර්මාන්තය හෝ ඒවා රැස්කර තිබීම, සම් ඇට කටු සහ සාදනලද පෝර ගබඩාකර තැබීම, සාදන පෝර හෝ යන්ත්‍රවලින් සාදන පෝර කර්මාන්තය පිණිස ගන්නා වෙන ද්‍රව්‍යයන් ගබඩාකර තැබීම, බර ප්‍රමාණයෙන් හොණ්ඩර 5කට වඩා බරවූ උම්බලකඩ රැස්කරතැබීම, කලුගල්, ක්‍රබෝක්ගල් හෝ බොරලු ගැනීමට හෑරීම, ගඩොල් සහ උළු කර්මාන්තය, හුණු පිළිස්සීම, සිසිල්බීම සෑදීම, මිනිරන් රැස්කර තැබීම හෝ ශුඬකිරීම.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 2,533, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සතුවූ ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 20වෙනි සිකුරාදා පස්වරු 2ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාතකොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 13ක්.

සිතියම 6,777. ගම—ගඟඉහලකෝරළේ තෙලිහුන්න යන ගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොඩියබැන්දහේන | ඈම්. ඈස්. ඩී. සිල්වා උන්නැහේ විසින් අල්ලා ගත් ඉඩම | තේ වවා තිබේ | 0 | 1 | 29 | 250 |
| 2 | දික්කුඹුරේහේන | සියදෝරිස් ද සිල්වා විසින් අල්ලාගත් ඉඩම | එම | 1 | 3 | 5 | 350 |
| 3 | කටුකිතුලේගොම්මහේ මූකලාන | — | මූකලාන, ඇලකට ඉතුරුකර තිබෙන හරිය (විකිණීමට නොවේ) | 1 | 3 | 11 | — |
| 5 | කටුකිතුලේගොම්මහේපතන | — | පතන එම | 0 | 2 | 6 | — |
| 6 | ඩුඹුදූලේපතන | — | එම | 0 | 0 | 18 | — |
| 7 | එම | — | කැලේ එම | 1 | 3 | 23 | — |
| 8 | එම | ඩී. පී. පැල්පොල උන්නැහේ විසින් අල්ලාගත් ඉඩම | තේවවා කැලේට ගොස් තිබේ | 2 | 1 | 33 | 200 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 9 | පුහුදලේපතන | .. ඞී. පී. පැල්පොල උන්නැහේ විසින් අල්ලාගත් ඉඩම | තේ වවා කැලේට ගොස් තිබේ වැව්ලි අහක්කර ඉඩම ඇල වල්වලට වෙන්කර තැබීමට (විකුණන්ට නොවේ) | .. 2 | 1 | 23 | — |
| 10 | එම | .. සිරියා පිස්ඔපිසර අල්ලාගත් ඉඩම .. | එම | .. 0 | 2 | 30 | — |
| 11 | එම | .. එම .. | .. තේවැවී කැලේටගොස් තිබේ .. | 0 | 0 | 26 | 250 |
| 12 | බරන්දරේහේන | .. එම | .. තේවවා වල්වැවී තිබේ | .. 0 | 3 | 34 | 300 |
| 13 | එම | .. එම | .. හේන .. | .. 0 | 1 | 19 | 100 |
| 14 | එම | .. එම | .. හේන, දිහගේ ඇලට ඉතුරුකිරීමට (විකුණන්ට නොවේ) | .. 0 | 1 | 5 | — |

මේ ඉඩම් සම්බන්ධ ප්ලෑන් කඩදාසි සර්වේයර් ජනරල් තුමාගෙන්ද, වැඩිදුර වෙන කාරණා මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,192, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 6වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ තල්පේපත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 10,946. ගම—උඩුබැවිටම. අයිතිකමකියන්න—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගෝනාමුල්ලේකන්ද | .. ගාල්ලේ පදිංචි ඊ. බී. වික්‍රම නායක උන්නැහේ .. | බැද්ද | 0 | 1 | 22 | 65 |

මෙම ඉඩම ගැන වැඩිදුර කාරණා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,193, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 11වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේ වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ කඩවත්සතරතුළ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

සිතියම 10,931. ගම—අන්කොක්කාවල. අයිතිකම්කියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මිනුඅන්දෙනියේකන්ද නොහොත් ගල්පොත්තේකන්ද නොහොත් පුහුල්හේන | දෙරපේ පදිංචි යක්ගහකුරුහේවාගේ පිලෝරිස් .. | .. මහබැද්ද | .. 1 | 0 | 5 | 207·50* |

* මිනිරන් හැරීමේ බලය ඇතුව රුපියල් 350.

මෙම ඉඩම ගැන වැඩිදුර කාරණාඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,194, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 19වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ තල්පේපත්තු කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 10,567. ගම—උඩුබැවිටම. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගෝනාමුල්ලේකන්ද | .. ගාල්ලේ පදිංචි ඊ. බී. වික්‍රමනායක | .. බැද්ද | .. 1 | 0 | 10 | 51·50 |

මෙම ඉඩම ගැන වැඩිදුර කාරණා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,302, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 30වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ උඩුකිඳ, බුත්තල සහ වියළුව කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 27ක්.

අන්තිම සිතියම 16. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ, හීන්නාරන්ගොල්ල.
මෙම් ඉඩම්වලට ඉල්ලුම්කාරයෙක් නැහැ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 23b | කිරින්දබද්ද සහ තවත් | .. දෙලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | .. 1 | 1 | 39 | —* |
| 23d | එම | .. පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | .. 0 | 3 | 33 | —* |
| 23e | එම | .. එම .. .. | .. 1 | 2 | 36 | —* |
| 23f | එම | .. එම .. .. | .. 0 | 1 | 24 | —* |
| 23g | එම | .. පතන, වගුරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | .. 2 | 1 | 1 | —* |
| 23h | එම | .. පතන, කුඹුරුවලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | .. 1 | 3 | 3[illegible] | —* |

* මෙම ඉඩම් නොවිකුණ ඉතුරුකරණු ලැබේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 23i | කිරින්දබද්ද සහ තවත් .. | කැලෑව, ඉතුරුකරනු ලැබේ, විකිනීමට නොවේ .. | 0 | 3 | 24 | —* |
| 23j | කිරින්දබැද්දේහෙල නොහොත් දූල්ගොල්ල .. | එම .. .. | 5 | 3 | 17 | —* |
| 23k | කිරින්දබැද්ද සහ තවත් .. | දෙලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | 4 | 1 | 7 | —* |
| 23l | එම .. | පතන, කුඹුරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 17 | —* |
| 23m | එම .. | පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | 0 | 0 | 19 | —* |
| 23n | කිරින්දබැද්දපතන නොහොත් දූල්ගොල්ල .. | පතන, දෙලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 27 | —* |
| 23o | එම .. | එම .. .. | 0 | 0 | 25 | —* |
| 23p | එම .. | පතන, කුඹුරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 17 | —* |
| 23q | එම සහ කොහාලානපතන .. | පතන, කුඹුරට සහ උල්පොතට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 1 | 2 | 7 | —* |
| 23r | කිරින්ද බැද්දේපතන නොහොත් දූල්ගොල්ල .. | පතන, කුඹුරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 0 | 4 | —* |
| 23w | එම සහ කොහාලාන්පතන .. | පතන, සුළු පාරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 1 | 20 | —* |
| G 3a | දූල්ගොල්ලේ වකහේන .. | හේන, කුඹුරට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 3 | 7 | —* |
| G 3b | එම .. | දෙලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ .. | 0 | 0 | 6 | —* |
| 23a | කිරින්දබැද්ද සහ තවත් .. | එම .. .. | 1 | 1 | 6 | —* |

අන්තිම සිතියම 215. ගම—බුත්තල පලාතේ කඩුකරුකෝරළේ, පල්ලේවරුදෙල.

ඉල්ලුම්කාරයෝ—(1) පලනිආන්ඩි, (2) කනුසියා, (3) අරුනාසලම්.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9b | මඩමේවත්ත .. | හේන .. .. .. | 0 | 3 | 29 | 25† |
| 14d | එම .. | එම .. .. | 1 | 0 | 11 | 25† |

සිතියම 2,007. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරළේ, රත්කරව්වේගම.

මෙම ඉඩම්වලට ඉල්ලුම්කාරයෙක් නැහැ. අයිතිකමකියන්නා—රඹුක්පොත ඕවපූ රටේමහත්මයා සහ තවත්.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | දීපවෙලඅරව .. | කුඹුර .. .. .. | 0 | 0 | 32 | 200 |

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | නිදන්ගොඩපතන නොහොත් කහටගහකඩුමුල්ලේපතන | පතන, පාරවල්වලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 2 | 15 | —* |

ඉල්ලුම්කාරයා—රත්කරව්වේ තැන්නේකුඹුරේගෙදර පුන්චිබන්ඩා.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 | එම .. | පතන .. .. .. | 0 | 3 | 36 | 30 |

මෙම ඉඩම්වලට ඉල්ලුම්කාරයෙක් නැහැ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5 | එම .. | පතන, ඇලට ඉතුරුකර තිබේ, විකිනීමට නොවේ | 0 | 1 | 25 | —* |

සිතියම 1,988. ගම—වියළුවපලාතේ වියළුවකෝරළේ, කීනහෙලගම.

අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, ගල්ගේගාවාගෙදර කලිඟුවා විසින් අල්ලාගෙන තිබේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | අගලකැපුවත්ත .. | වත්ත, කෙසෙල්ගස්ද, පුවක්ගස්ද, කැකුනගස් සහ අවුරුදු 10ක් පමණ පරණ පිදුරු සෙවිලිකරපු ගෙයක්ද තිබේ .. | 1 | 0 | 20 | 50† |

* මෙම ඉඩම් නොවිකුණ ඉතුරුකරනු ලැබේ. † දෙවෙනි වතාවට ප්‍රසිද්ධකළා ඇත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර් ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,303, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 30වෙනි දිනවූ බෘහස්පතින්දා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ වෙල්ලස්ස කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

අන්තිම සිතියම 168. ගම—වෙල්ලස්ස පලාතේ මැදගම්පත්තුකෝරළේ බකිනිගහවෙල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1bj | වාලාගෙදරවත්ත .. | .. ඇල්. බී. දෙඩංවැල්ල | .. හේන .. | .. 1 | 3 | 2 |
| 1bl | රත්පහේහේන .. | .. තමනගෙදර කිසාහාමි | . සිහින් කැලෑව | .. 2 | 0 | 30 |

බදු කොන්දේසි.

(a) ඉහත සදහන්වෙන ඉඩම් සදාකාලිකේට බදුදෙනු ලැබේ.

(b) මෙම ඉඩම් එකින් එකට "පිරිමියම්" වන තක්සේරු මුදල් මෙසේය, රුපියල් 13 සහ රුපියල් 16·50ක් වේ.

(c) මෙම ඉඩම්වලට අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් රුපියල් 1·50හ ගණනේ බදු මුදල් ගෙවිය යුතුයි.

(d) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(e) ඒජන්ත උන්නාන්සේගේ අවසර නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(f) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගණලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පල කරණු ලැබේ.

(g) පලතුරු වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(h) ඉඩම් වැසියන්ට උවමනාකරණ පලතුරු වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(i) බදුකාරයා විසින් මෙම ඉඩම් අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද, ඉතුරු ඉඩම් තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(j) අවුරුදු 30කට වරක් බද්ද අලුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙව්වාවූ බදු මුදලින් භාගයකට වැඩිනොවේ.

(k) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කිරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

**No. 993, P. of S.**—සබරගමු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුවසන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 19වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

සිතියම 2,259. ගම—මාදම්පේ, අටකලන්කෝරළේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 826 | උඩහවත්තේහේන | කේ. ඇල්. අප්පුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | බතල ආදිය වවාතිබෙන ඉඩම | 0 2 27 | 30 |
| 827 | දෙමටගස්වත්තේහේන | ඇලිස්නෝනාහාමිනේ විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | වත්ත එහි ගෙයක්ද සාදාතිබේ | 2 0 15 | 50 |
| 830 | කුඹුරගොඩහේන | සියදෝරිස් විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | බතල ආදිය වවාතිබෙන ඉඩම | 0 3 16 | 30 |
| 831 | කෝන්ගහවත්ත | ඩබ්ලිව්. ගුනයා සහ තවත් අය විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | වත්ත | 1 3 32 | 200 |
| | | සිතියම 21. ගම—තොරගල්ල, නවදුන්කෝරළේ. | | | |
| 3*f* | ගන්ඉමේහේන | ඇන් කේ. කුරේ | ලන්ද | 0 3 17 | 75 |
| | | සිතියම 67. ගම—පාතගම, නවදුන්කෝරළේ. | | | |
| 18*bo* | පහළ කුරුවිටි කැන්නේ හේන | අඟුරුකාරගේ අල්ලිසා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | වත්ත | 0 3 13 | 100 |
| | | සිතියම 38. ගම—කිරිඇල්ල, නවදුන්කෝරළේ. | | | |
| 13*al* | කුඩාගෙහේනේවත්ත | ගිරෝනිසා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | අවුරුදු 4ක් පමණවූ පොල් | 0 3 14 | 100 |

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 1වෙනි දින කොළඹ,
මහලේකම්කාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්කාරීස් වර්මහ.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මෝරේ පාරේ හැතැප්ම 26¾ ලඟ ප්‍රසිද්ධ වැඩදෙපාර්තමේන්තුවේ කුලීකාරයින්ගේ ලැයින් සහ කක්කුස්සි ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 6,875. ගම—නෝර්වුඩ්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | නිවුවැලි | ස්වදේශීන්ගේ ඉඩම යනාදිය | අයිතිකාරයෝ, නිවුවැලිවත්ත | 0 0 15·06 |
| 2 | එම | මුඩුබිම | එම | 0 0 05·12 |
| 3 | එම | ස්වදේශීන්ගේ ඉඩම යනාදිය | එම | 0 0 01·61 |
| 4 | එම | විගුරු ඉඩම | එම | 0 0 12·59 |
| 5 | එම | තේ | එම | 0 0 02·99 |
| 6 | එම | තේ | එම | 0 0 01·87 |
| 7 | එම | තේ | එම | 0 0 08·15 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 30වෙනි දින පස්වරු 1ගේ කානිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 8වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝන්,
ආණ්ඩුවේ ඒජන්ත වර්මහ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 7,047.]

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900, සහ 1903ගේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මනත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතික්මක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මනත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශේෂ මනත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත්පත්තුවේ යටිකහකෝරළේ හේනේගෙදර යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ * පෙනියන 4,490 මුල් සිතියමේ ʊ 108¾න් පෙනෙන රූඩ් 1කුත් පර්චස් 27ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් පාර කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට සී. පී. ද සිල්වා විසින් අයිතිකම්කියන සිල්වාතැන්නේවත්තද; නැගෙණහිරට මූකලන්යාය යන ගමේ ගම්ඉමද, සී. පී. ද සිල්වා විසින් අයිතිකම් කියන සිල්වාතැන්නේවත්තද; දකුණට සී. පී. ද සිල්වා විසින් අයිතිකම්කියන සිල්වාතැන්නේවත්තද, ගල්කුඹුර යන ගමේ ගම්ඉමද; බස්නාහිරට සී. පී. ද සිල්වා විසින් අයිතිකම්කියන සිල්වාතැන්නේවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2100වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 116—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 7,048.]

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත් වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත්පත්තුවේ යටිකහකෝරළේ මූකලන්යාය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 4,490 මුල් සිතියමේ F 109½න් පෙනෙණ පර්චස් 30ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් පාර කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට පිදුව හිට කිරින්දූවට යන පාරද; නැගෙණහිරට සී. පී. ද සිල්වා විසින් අයිතිකම්කියන සිල්වාතැන්නේවත්තද; දකුණට හේනේගෙදර යන ගමේ ගම්ඉමද; බස්නාහිරට සී. පී. ද සිල්වා විසින් අයිතිකම් කියන සිල්වාතැන්නේවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2101වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 117—1918.]

---

[කුරුණෑගල දැන්වීම නො. 7,049.]

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 8වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත් වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත්පත්තුවේ යටිකහකෝරළේ ගලකුඹුර යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ * පෙනියන 4,490 මුල් සිතියමේ W 109න් පෙනෙණ පර්චස් 35ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් පාරකියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට 300,295 පිඹුරුකඩදාසියේ ජේන ඉඩමද, හේනේගෙදර යන ගමේ ගම්ඉමද; නැගෙණහිරට 300,295 පිඹුරුකඩදාසියේ ජේන ඉඩමද; දකුණට 300,295 පිඹුරුකඩදාසියේ ජේන ඉඩමද; බස්නාහිරට වීරමඩිත්තරෝදේ යන ආණ්ඩුවේ මූකලානද, 300,295 පිඹුරුකඩදාසියේ ජේන ඉඩම්ද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2101වෙනි පිටේ ප්ලෑනය බලනු

[කුරුණෑගල වි. ම. 118—1918.]

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම්.

මෙහි පහත සඳහන්වන ගාලු දිසාවේ දොඩන්ගොඩ තොටුපල් රේන්ද වර්‍ෂ 1919ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් දෙසැම්බර් මස 31වෙනි දින දක්වා ආණ්ඩුවෙන් බදු ගැණීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර ගාල්ලේ රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා විසින් භාරගනු ලැබේ.

2. මතුකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්විලොප් උඩ Tender for Dodangoda Toll Rents "දොඩන්ගොඩ තොටුපල් රේන්ද සඳහා ඉල්ලුම්පත්‍ර" යන වාසගම ඇතුව වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 16වෙනි සෙනසුරාදා පස්වරු 2ක වනතුරු ගාල්ලේ කච්චේරියේදී භාරගනු ලැබේ. එවිට ඒවායේ මුද්‍ර කඩාබලනවා ඇත. තවද ඉල්ලුම්පත්‍ර දී සිටින සැමදෙනාම ඉදිරිපිටට ඇවිත් නැතහොත් තමන් විසින් වෙන අයෙකුට නීති බලයක්දී ඔහු එවා හෝ ඒ දෙනලද ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඇත්තේ ඒවා බවට ප්‍රධානතුමාට ඒත්තුගන්වන්ට ඕනෑය.

සතුටුදායක ඉල්ලුම්පත්‍රයක් ලැබුණේ නැත්නම යම් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර නිෂ්ප්‍රභාකිරීමේ අයිතිවාසිකම් ප්‍රධානතුමාට තබාගන්නාලදී. තවද සෑහෙන ඉල්ලුම්පත්‍රයක් නොලද්දේනම් එදිනම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ප්‍රධානතුමාට පුලුවන්වේ.

3. ප්‍රධානතුමා විසින් උතුමාණන්වහන්සේ වෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දහයෙන් කොටසකට වැටහෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණකුත් නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්නට යෙදුනිනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30දවසකදී එම ඉල්ලු ගණනෙන් දෙකෙන් පංගුවකට ඇප මුදලෙන් හෝ නීබා සම්පූර්ණකරන්ට ඕනෑය. තවද ඇප ඔප්පු සම්පූර්ණකරනතුරු මාසෙක බදු මුදල අත්පිට බඳින්ට ඕනෑය.

4. මුදලෙන් ඇප සම්පූර්ණකරනවානම් විකිණීම් දවසේ ඇපේට තබන්ට යෙදුන දහයෙන් කොටසකට වැටෙන මුදල අවුරුද්දේ අන්තිම භාරමාසෙට ගෙවියයුතු මුදලෙන් කොටසක් හැටියට භාරගනු ලැබේ. වරිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පූවලින් සම්පූර්ණකරනවානම් ඉහතකී දහයෙන් කොටසක් රේන්දේ මුදල් ප්‍රවේසමට ප්‍රධානතුමා තබාගන්නට යෙදෙනවා ඇත.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත් උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඉඩම් තක්සේරුකෙරීමට සහ ඇප ඔප්පු රිජිස්තර්කිරීමට ගෙවිය යුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්නට ඕනෑය.

6. ගැණුම්කාරයා විසින් රේන්දපලේ පාරේ දෙපැත්තේ යාර 100ක් දුර පෙනෙන රතු එලි දෙකක් තබන්ට ඕනෑය.

7. ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබා ගත යුතුයි. මෙම සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

මේ ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ දිස්ත්‍රික්රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

ආර්. බී. හැලින්ස්,
ගාර් පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන.

වර්‍ෂ 1918ක්වූ ඔක්තෝබර මස 29වෙනි දින
ගාල්ලේ දිස්ත්‍රික් රෝඩ්කොමිටි කන්තෝරුවේදීය.

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්‍ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

මෙහි පහත සඳහන්වන දැනට තිබෙන අරක්කු ගුදම වර්‍ෂ 1919—20 දක්වා සහ ඉන්පසු වසාදමනු බව මෙයින් දන්වමි. එම නිසා මේ සම්බන්ධව යම් කාරණාවක් පෙන්නුම්කරන්ට තිබේනම් එය ලියවිල්ලකින් හෝ කටවචනයෙන් ඌව දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ වෙත ලබන දෙසැම්බර් මස 13වෙනි දින දවල් 12යේ සිට සවස 2 දක්වා හෝ ඊට මත්තෙන් එවියයුතු බව මෙයින් දන්වමි.

වර්‍ෂ 1918ක්වූ ඔක්තෝම්බර් මස 26වෙනි දින
බදුල්ලේ කච්චේරියේදීය.

ඇජ්. බාව්ලව්,
ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වමහ.

වසාදමන්ට යන අරක්කු ගුදම.

| නො. | පලාත. | ගම. |
|---|---|---|
| 4 | .. උඩුකිද .. | .. මහවෙලගම |

## ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීම සම්බන්ධ ඉල්ලුම්පත්‍ර.

ආණ්ඩුව සන්තක ඉඩම් මැනීමේ අයදුම්පත්‍ර පිළිබඳ උතුරු මධ්‍යම පලාතේ අවසාන කරණු ලබන භූමි ප්‍රදේශ.

උතුරු මධ්‍යම පලාතේ ආණ්ඩුව සන්තක ඉඩම් මුදලට හෝ බද්දට ගැනීමේදී යවනු ලබන අයදුම්පත්‍ර සම්බන්ධව පවත්වනු ලබන මැනීම් එම භූමිවල අක්කර ප්‍රමාණයේ හැටියට මින් ඉදිරියට භාරගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එම පලාත ප්‍රදේශ තුනකට බෙදා තිබේ.

කුන්චුත්තු, කල්පේ; මිහපොතන, කනාදර සහ උඩ්ඩියන් කුලම කෝරල අංක 1 දරණ ප්‍රදේශයට ඇතුලත්වද.

උලගල්ල, කලාගම්, නීනම්පහ, උන්දුරුව, කිරලාව, මාමිනිය සහ මානාම්බුව කෝරලද, තමන්කඩුව සහ එගොඩ පත්තුද අංක 2 දරණ ප්‍රදේශයට ඇතුලත්වද.

විල්ලච්චිය, නුවරගම්, කඩවත්, එප්පාවල සහ තැන්දේ කෝරල අංක 3 දරණ ප්‍රදේශයට ඇතුලත්වද වේ.

3. වර්‍ෂ 1918ක්වූ දෙසැම්බර් මස 15වෙනි දින අංක 3 දරණ භූමි ප්‍රදේශයේ කටයුතු අවසාන කරණු ලැබේ. මෙහි තුළ පිහිටි ඉඩම් සම්බන්ධ යවනලද අයදුම්පත්‍ර ඉහතකී දිනට පසු එම ඉඩම් මැනීම පිණිස සර්වේයර් ජනරල් උන්නාන්සේ වෙත යවනු නොලැබේ. එසේද උවත් ඉඩම් විකිනීම හෝ බද්ද ගැණ යම් විරුඩකම් තිබේදැයි දැනගැනීමට එකී ප්‍රදේශය තුළ ඉඩම් ගැණ එවනලද අයදුම්පත්‍ර රෙජිස්ටර්කිරීම පිණිස මාවෙත එවීම වලක්වනු නොලැබේ.

4. මීට පසු මැනීම පිළිබඳව අවසානකරණු ලබන්නේ අංක 1 දරණ ප්‍රදේශයද, ඊට පසු පිළිවෙලින් අංක 2 දරණ ප්‍රදේශද වේ. මෙකී භූමි ප්‍රදේශ 2 තුළ ආණ්ඩුව සන්තක ඉඩම් මිලේට හෝ බද්දට ගැනීම පිණිස එවනලද අයදුම්පත්‍ර නොපමාව මාවෙත එවිය යුතුයි.

5. අංක 1 දරණ භූමි ප්‍රදේශයේ අයදුම්පත්‍ර භාරගැනීමේ අවසානකරණ දිනය ලඟදීම ප්‍රසිඩ කරණුලැබේ. තවද අංක 3 දරණ භූමි ප්‍රදේශයේ සියලු කටයුතු සම්පූර්ණ කරණ දිනයද ඉන් ප්‍රකාශවෙත්.

එච්. ආර්. ප්‍රිමන්,
උතුරු මධ්‍යම පලාතේ ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1918ක්වූ ඔක්තෝබර්
මස 31වෙනි දිනදීය.

## සනීපාරක්‍ෂක සභාවලට නිලනොලත් සමාජිකයින් තෝරාගැනීමේ දැන්වීම.

තිරිකුණාමලේ ලෝකල්බෝඩ් සභාවට නිලනොලත් සමාජිකයන් පත්කිරීම.

තිරිකුණාමලේ ලෝකල්බෝඩ් සභාවට 1919 සහ 1920වෙනි අවුරුදුවලට නිල නොලත් සමාජිකයන් පත්කිරීමේදී නිල නොලත් සමාජිකයන් මෙන් පත්කරණු ලැබීමට සුදුස්සන් ගේද කැමැත්තදීමට සුදුස්සන්ගේද නාම ලේඛන ඉහතකී සභාවේ කන්තෝරුව පවත්වන කාලය තුළදී එහිදී කියවා බැලීමට අවකාශ ඇර තිබෙන බවද ඉහතකී ලේඛනවල ඇතුළත්කිරීමට යම් නමක් තිබේනම් ඒ ගැණ තිබෙන අයිති වාසිකම්වලටද ඇතුළත්කර තිබෙන නමකට විරුඩව යමක් කියන්ට තිබේනම් ඊටද ඇහුම්කන්දීම පිණිස වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 23වෙනි සෙනසුරාදා පෙරවරු 10ට මා ඉහතකී කන්තෝරුවට පැමිණෙන බව මෙයින් දැනුම්දෙන්ට යෙදුනා ඇත.

ආර්. ඒ. ජී. පැස්ටින්,
නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වමහ.

වර්‍ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දින
මඩකලපු කච්චේරියේදීය.

## සුප්‍රිම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරු කටයුතු උතුම්වූ සුප්‍රිම්උසාවියෙන් මට ලැබීතිබෙන අඥාවකෑබලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම් කුරුණෑගල දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්‍ෂ 1918ක්වූ දෙසැම්බර් මස 2වෙනි දින පෙරවරු 11පැය පටන් මහනුවර මගුල්මඩුවේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණී හිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ඇස්. බී. සමරසිංහ,
වයඹ දිසාවේ පිස්කල් වෙනුවට.

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 2වෙනි දින
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

## අ නු. දැ න් වී ම.

මෙහි පහත අත්සන්කරන මීගමු දිස්ත්‍රික්කුවේ යටියන පදිංචි වනසිංහආරච්චිගේ ජෙකබ් ක්‍රිස්තෝපර් වන මා කෑගල්ල දිස්ත්‍රික්කුව ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියා සහතික කෙරීමට බලයලත් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් මෙන් පත්කරනුලබන ලෙස මෙතැන්පටන් තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කරසිටින බව වර්ෂ 1907 ත් අංක 1 දරණ ආඥාපණතේ 8වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ච. ජෙ. ක්‍රිස්තෝපර්.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස
7වෙනි දින යටියනදීය.

---

දැනට හංවැල්ලේ පදිංචි මුල්ලේරියාවගේ බෙම්පි කුලතිලක වන මම වර්ෂ 1907තේ අංක 1 දරණ ආඥාපණතට යාකර තිබෙන අඞ්ක 1B අක්ෂරය දරණ හැඩසුල් පත්‍රයේ දෙවෙනි වගන්තියට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් කටයුතුකිරීමට පත්කරනු ලැබීම පිණිස මෙතැන් සිට තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලුම්කරන බව මෙයින් දැනුම්දෙමි.

ඈම්. බී. කුලතිලක.

---

සියනෑකෝරළේ මැදපත්තුවේ අලුත්ගම විදියවත්තේ දැනට පදිංචි බියන්විලගේ ජෙන් එලාරිස් වන මම හලාවත දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරනු ලැබීම පිණිස මෙවක් පටන් තුන්මාසයක් ඉකුත්වූපසු රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලන්ට අදහස්කර සිටිනබව වර්ෂ 1907 අඞ්ක 1 දරන ආඥාපණතේ 8වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

බී. ජෙන් එලාරිස්.

1918 නොවැම්බර් 2
විදියවත්ත අලුත්ගම.

---

මෙහි පහත අත්සන්කරණ මඩකලපු දිස්ත්‍රික්කුවේ මැන්මුනි පත්තුවේ කොටමුණේ, ඔඩ්විත් තම්බිමුත්තු තම්බිරාජා මම මඩකලපු දිස්ත්‍රික්කුවේ දෙමළ භාෂාවෙන් ඔප්පුලියා සහතික කිරීමට බලය ඇති නොතාරිස්කෙනෙකුමෙන් මා පත්කරණ ලෙස මෙතැන් පටන් තුන්මාසයක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලීමට අදහස්කරගන සිටින බව වර්ෂ 1907 ත් අඞ්ක 1 දරණ ආඥාපනතේ අටවෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඕ. ඊ. තම්බිරාජා.

වර්ෂ 1918ක්වූ සැප්තැම්බර් මස
28වෙනි දින යාපනයේදීය.

---

මෙහි පහත අත්සන්කරන ජපනේ දිස්ත්‍රික්කේ නැගෙනහිර වලිගාමම් කොපායි (දැනට ජපනේ පදිංචි) කන්දසියා සෝමසුන්දරම් වන මම ජපනේ දිස්ත්‍රික්කය ඇතුළත දෙමළ භාෂාවෙන් ඔප්පු ලිවීමට බලය ඇති නොතාරිස් කෙනෙකු මෙන් මා පත්කරනලෙස මෙතැන්පටන් තුන්මසක් ගියතැන රිජිස්ත්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කරගන සිටින බව වර්ෂ 1907 අංක එක දරණ ආඥාපණතේ 8වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

කේ. සෝමසුන්දරම්.

වර්ෂ 1918ක්වූ ඔක්තෝබර් මස 21
වෙනි දින ජපනේදීය.

---

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.